IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - I කොටස - 2013

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2015 මාර්තු)

## BLE 105 - නෛතික පරිසරය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට(05) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(6) අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.

01. "ශ්‍රී ලංකාව විශාලත්වයෙන් කුඩා රටක් වුව ද , විවිධ නීති ක්‍රම එකිනෙකට යාබදව එක්ව පවතින සංකීර්ණ වූ නීති පද්ධතියකට හිමිකම් කියන බැවින් මෙරට බල පවත්නා නීති පද්ධතිය කෙනෙකු මවිතයට පත් කරවන්නකි".

උක්ත ප්‍රකාශය සමඟ ඔබ එකඟ ද? ඔබගේ පිළිතුර හේතු සහිතව ලියා දක්වන්න.

02. (i) රෝම - ලන්දේසි නීතිය ශ්‍රී ලංකාවේ 'පොදු නීතිය' ලෙස භාවිතා කරන්නේය යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(ii) රෝම - ලන්දේසි නීතිය "ශේෂ්‍ය නීතිය"වශයෙන් භාවිතා කෙරෙන්නේය යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(iii) බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට යටත්ව තිබූ යටත් විජිතයක් වශයෙන් ලංකාව තුල 1799 ප්‍රකාශනය මඟින් රෝම - ලන්දේසි නීතිය අඛණ්ඩව බල පැවැත්වීමට ඉඩ දෙනු ලැබූ බ්‍රිතාන්‍ය යටත් විජිත ප්‍රතිපත්තිය විස්තර කරන්න.

03. (i) "ද්වි විවාහය යන වරද සම්බන්ධ සාපරාධී වගකීමෙන් ගැලවීමට උත්සාහ දරණ පුද්ගලයින් හට මුස්ලිම් නීතිය ක්ෂේම භූමියක් බවට පත් වී ඇත". විවේචනාත්මකව විමසන්න.

(ii) "ශ්‍රී ලංකාවේ පවතින එකම පිරිසිදු පුද්ගල නීතිය මුස්ලිම් නීතියයි" උක්ත ප්‍රකාශයේ සත්‍යතාව පැහැදිලි කරන්න.

04. ශ්‍රී ලංකාවට ඉංග්‍රීසි නීතිය ප්‍රවේශ වූ ආකාරයන් නිදර්ශන සහිතව සාකච්ඡා කරන්න.

05. චෙන්නායි හි අධ්‍යාපනය ලැබූ මන්නාරමේ ද්‍රවිඩයකු වූ රාජන් රැකියාවක් සඳහා මැදපෙරදිග ගියේය. එහි දී ඔහුට පහත රට සිංහල කාන්තාවක් වන ශ්‍රියානි මුණ ගැසෙන අතර දෙවසරක ඇසුරකින් පසුව රාජන් ශ්‍රියානි සමඟ විවාහ විය. රාජන්ට ඔහුගේ පිය උරුමයෙන් පේදුරුතුඩුවේ පිහිටි ඉඩමක් සහ නිවසක් හිමි වූ අතර ඔහු ඉපැයූ මුදල් භාවිත කරමින් කොළඹ කොටහේන ප්‍රදේශයෙන් නිවසක් මිල දී ගත්තේය. ශ්‍රියානිට යාපනයේ ද්‍රවිඩ කාන්තාවක් වූ තම මිත්තනිය වන විජය ලක්ෂ්මි ගෙන් ගොවිපළක් උරුම විය.

(i) රාජන්ට, ශ්‍රියානිට සහ ඔවුන්ගේ දේපළ වලට අදාළ වන නීතිය කුමක් දැයි පෙන්වා දෙන්න.

(ii) ඔවුන් එකිනෙකාගෙන් නීත්‍යානුකූලව දික්කසාද වූයේ නම් ඔබගේ පිළිතුර වෙනස් වේ දැයි පැහැදිලි කරන්න.

06. (i) ශ්‍රී ලංකාවේ අධිකරණ ව්‍යුහය තුළ ක්‍රියාත්මක වන අනුගම්‍ය පූර්ව නිදර්ශන න්‍යාය (Doctrine of Stare Decisis) යනුවෙන් අදහස් වන්නේ කුමක් දැයි පැහැදිලි කර එහි යහපත් සහ අයහපත් ලක්ෂණ වේ නම් ඒවා කවරේදැයි සැකෙවින් සඳහන් කරන්න.

(ii) "නුසුදුසු යැයි හැඟෙන නඩු තීන්දු මඟ හැරවීම සඳහා විනිශ්චයකරුවන්ට සෑහෙන නිදහසක් ඇත". අනුගම්‍ය පූර්ව නිදර්ශන න්‍යාය ඇසුරින් මෙම ප්‍රකාශය සාධක සහිතව පැහැදිලි කරන්න.

07. මහරගම පොදු වෙළඳ සංගමයට අයත් රෙදිපිළි වෙළඳුන් කිහිපදෙනෙක් තම වෙළඳසැල් ඉදිරිපිට පිහිටි ප්‍රසිද්ධ කාණු පද්ධතිය ලෑලි වලින් වසා උත්සව සමයන් හිදී තම වෙළඳ භාණ්ඩ විකිණීමෙහි නිරත වී සිටිති. ඉවත් කරනු ලබන පොලිතීන් සහ අනිකුත් අපද්‍රව්‍ය කාණු පද්ධතියට මුදා හැරීම නිසා කාණු පද්ධතිය අවහිර වීම හේතුවෙන් මහරගම නගරයේ අදාළ ප්‍රදේශය වැසි දින වල ජලයෙන් යට වේ. තම වෙළඳසැල් ජලයෙන් යට වීමට හේතුව කාණු පද්ධතිය අවහිර කිරීම බව ප්‍රකාශ කරමින් තවත් වෙළඳසැල් හිමියන් පිරිසක් නීතියේ පිහිට පැතීමට අපේක්ෂා කරයි. කාණු පද්ධතිය වසා තම භාණ්ඩ අලෙවි කිරීම දීර්ඝ කාලයක් තිස්සේ සිදුකෙරෙන බව මහරගම පොදු වෙළඳ සංගමයේ අදාළ රෙදිපිළි වෙළඳුන් කියා සිටියි.

එම සිරිත මත පිහිටා තම අයිතිවාසිකම් නීත්‍යානුකූල ලෙස තහවුරු කර ගැනීමට එම වෙළඳුන්ට ශ්‍රී ලංකාවේ නීතිය තුළ අවකාශයක් ඇත්දැයි සාධක සහිතව සාකච්ඡා කරන්න.

08. (i) 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මහජනතාව සතු අධිකරණ බලය පාර්ලිමේන්තුව මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා නිර්මාණය කර ස්ථාපිත කරනු ලැබ ඇති අධිකරණ ව්‍යුහය පැහැදිලි කරන්න.

(ii) සිවිල් සහ අපරාධ අධිකරණ බලය ක්‍රියාවට නැංවෙන අධිකරණ ව්‍යුහයන් සැකෙවින් ලියා දක්වන්න.

(iii) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම සම්පාදනය කෙරෙන විධිවිධාන කවරේදැයි පෙන්වා දෙන්න.